# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report
# 2023




තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව
தகவலுக்காக உரிமை ஆணைக்குழு
Right to Information Commission

# වාර්ෂික වාර්තාව - 2023

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
## ශ්‍රී ලංකාව


**කාර්යාලය**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
කාමර අංක **203 – 204 ,** ගොඩනැගිලි අංක - **2**
බණ්ඩාරනායක ජාත්‍යයන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය
බෞද්ධාලෝක මාවත
**කොළඹ 07**
ශ්‍රී ලංකාව

දුරකතන අංකය - **0112691625**
info@rtic.gov.lk
**www.rticommission.lk**

## පටුන


1. හැඳින්වීම
   - 1.1 තොරතුරු වලට ප්‍රවේශවීම වීම සම්බන්ධයෙන් පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම 3
   - 1.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත 3
   - 1.3 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව 4
   - 1.4 කොමිෂන් සභාවේ දැක්ම 5
   - 1.5 කොමිෂන් සභාවේ මෙහෙවර 5
   - 1.6 කොමිෂන් සභාවේ අරමුණු 5

2. කොමිෂන් සභාවේ කාර්යය, කර්තව්‍ය හා බලතල
   - 2.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 14 වගන්තිය අනුව කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍ය 6
   - 2.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වගන්තිය අනුව කොමිෂන් සභාවේ බලතල 6
   - 2.3 වත්මන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව 7

3. කොමිෂන් සභාවේ කාර්යය සාධනය
   - 3.1 අභියාචනා ලැබීම 8
   - 3.2 අභියාචනා විභාග කිරීම 12

4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ දේශීය හා ජාත්‍යන්තර මැදිහත්වීම
   - 4.1 දේශීය මැදිහත්වීම
     - 4.1.1 රජයේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 13
     - 4.1.2.රාජ්‍ය ආයතන සඳහා කොමිෂන් සභාව සාමාජිකයන්ගේ සම්පත් දායකත්වය 14
     - 4.1.3. ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම 15
   - 4.2 ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 15

5. කොමිෂන් සභාවේ අධිකරණ කටයුතු 17

6. වාර්තා ආදිය ඉදිරිපත් කිරීමට පොදු අධිකාරිය සතු කාර්යය භාරය 39

7. තොරතුරු සඳහා තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අන්තර්ජාතික දිනය සැමරීම 47

8. පරිපාලනය හා මූල්‍ය කාර්යය සාධනය
   - 8.1 කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය 48
   - 8.2 මූල්‍ය පාලනය 48

# 1. හැඳින්වීම

2023 වර්ෂය තුළ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සමස්ත කාර්යය සාධනය පහත පරිදි වේ.

## 1.1 තොරතුරු වලට ප්‍රවේශවීම වීම සම්බන්ධයෙන් පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම

1978 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් 14(අ) ලෙස නව ව්‍යවස්ථාවක් ඇතුළත් කරමින් තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස හඳුන්වා දෙන ලදි.

## 1.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කිරීම, තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම් බලාත්මක කිරීම මගින් පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාව හා ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගීවීම සඳහා ද රටේ පොදු ජන ජීවිතයේදි සක්‍රීය ලෙස සහභාගි විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2016 අංක 12 දරන තොරුතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කර, 2016 අගෝස්තු මස 04 දින ගරු කතානායකතුමා විසින් සහතික කරනු ලැබූ අතර 2017 පෙබරවාරි මස 03 වන දින සිට ක්‍රියාත්මක විය.

එකී පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව, 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පොදු අධිකාරියක සන්තකයේ භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිය අයිතිවාසිකම සෑම පුරවැසියෙකුටම පවතින බවට නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක් යන්න පුළුල් ලෙස පහත පරිදි අර්ථ නිරූපනය කර ඇත. පොදු අධිකාරියක් යන්නෙන් -

- (අ) ආණ්ඩුවේ අමාත්‍යාංශයක්
- (ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරන සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක්, හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩලයක් හෝ කාර්යාලයක්
- (ඇ) ආණ්ඩුවේ දෙපර්තමේන්තුවක්
- (ඈ) රාජ්‍ය සංස්ථාවක්
- (ඉ) සිය කොටස් වලින් සියයට විසිපහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සහ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්;

- (ඊ) පළාත් පාලන ආයතනයක්¦
- (උ) ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක් හෝ බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයක් ඉටු කරන එහෙත් ඒ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමා වූ පෞද්ගලික හිමිකාරීත්වයක් හෝ සංවිධානයක්
- (ඌ) පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතනයක්
- (එ) මහජනතාව වෙත සේවයක් ලබා දෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබා දෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයේ අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන
- (ඒ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන" හදුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන පෞද්ගලික විශ්වවිද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන
- (ඔ) යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන" පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබා දෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මූල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබා දෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන
- (ඕ) යුක්තිය පසිදලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන,

## 1.3 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 11 වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කර ඇත. එය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයකි. ඒ අනුව 2016 ඔක්තෝබර් 01 වන දින ප්‍රථම වරට කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කරන ලදී. පොදු අධිකාරීන් වෙත පවරා ඇති කාර්යය නිසි පරිදි ඉටු කරන්නේද යන්න අධික්ෂණය කිරීමට සහ පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව, පනතේ විධිවිධාන උල්ලංඝනය කරන්නන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ද කොමිෂන් සභාවට බලය ඇත. තවද පනතේ 39 (1)(ඉ) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ලද පුද්ගලයන්ට එරෙහිව අපරාධ නඩු පැවරීමේ බලයද කොමිෂන් සභාවට ඇත.

එමෙන්ම කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකෘතිය හා ආකාරය, පරීක්ෂණයක් පැවැත්වීමේදි අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය හා තොරතුරු සැපයුම සම්බන්ධයෙන් වූ ගාස්තු පිළිබඳ

රීති සකස් කිරීමේ බලයද කොමිෂන් සභාව සතු වේ. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2004/66 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2017 පෙබරවාරි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගාස්තු හා අභියාචනා කාර්‍ය පටිපාටිය සම්බන්ධයෙන් රීති මාලාවක් හඳුන්වා දී ඇත.

## 1.4 කොමිෂන් සභාවේ දැක්ම

ශ්‍රී ලාංකේය පුරවැසියන්ට ඔවුන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ඵලදායි ලෙස ක්‍රියාත්මක කරගත හැකි බව සාක්ෂාත් කිරීම.

## 1.5 කොමිෂන් සභාවේ මෙහෙවර

සියලු ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය සංවර්ධනය කරමින් සහ සුරක්ෂණය කරමින්, ඵලදායි විනිශ්චය කිරීම් සහ සියලු පොදු අධිකාරීන්ගේ භාවිතාවන් අධීක්ෂණය හරහා විනිවිදභාවයේ සහ යහපාලනයේ සංස්කෘතියක් අනුදකිමින් තමන්ට අදාළ සියලු තොරතුරු පිළිබඳ පුරවැසියන් වඩාත් සාවධානී කිරීමට මහපෙන්වමින් ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම.

## 1.6 කොමිෂන් සභාවේ අරමුණු

- ❖ වඩා ඵලදායි විනිශ්චයන් සැපයීම සහ ඒවා බලාත්මක කිරීම: පොදු අධිකාරීන් සහ තොරතුරු ඉල්ලුම්කරුවන් අතර ඇතිවන ගැටුම් ඵලදායී ලෙස විනිශ්චය කිරීම.
- ❖ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සහාය දැක්වීම: රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේදී සහයෝගයෙන් කටයුතු කිරීම, උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තොරතුරු දැනැගනීමේ අයිතිවාසිකම පිළිබඳ විශේෂිත පුහුණුව සඳහා සහාය දැක්වීම.
- ❖ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම: කොමිෂන් සභා වෙබ් අඩවිය සහ මාධ්‍ය අන්තර්ක්‍රියා හරහා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම.
- ❖ වාර්තා කළමනාකරණය වැඩිදියුණු කිරීම: මාර්ගෝපදේශන ලබාදීම මඟින්, තොරතුරු කළමනාකරණය සම්බන්ධයෙන් නිශ්චිත උපදෙස් ලබා දීම.
- ❖ ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ඉහළ නැංවීම: මාර්ගෝපදේශ නිකුත් කිරීම, අවම ප්‍රමිතීන් දැක්වීම, දැනට පවත්නා නීතිවල සංශෝධනවලට මුලපිරීම සහ කාලාන්තරික ඇගයීම් සිදුකිරීම.
- ❖ ඵලදායී අධීක්ෂණ සහ ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම: උචිත ඔන්ලයින් විසඳුම් සහ ඇගැයීම් මෙවලම් උපයෝගීකර ගැනීම හරහා, පොදු අධිකාරීන් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන ආකාරය ඵලදායී ලෙස අධීක්ෂණය සහ ඇගයීම.

# 2. කොමිෂන් සභාවේ කාර්යය, කර්තව්‍ය හා බලතල

## 2.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 14 වගන්තිය අනුව කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍ය

- මෙම පනත යටතේ පොදු අධිකාරීන් වෙත කාර්‍ය නිසි පරිදි ඉටු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කරන්නේද යන්න සහතික වීම
- ප්‍රතිසංස්කරණය සමාලෝචනය කිරීම සඳහා අවශ්‍ය පොදු නිර්දේශ ස්වභාවයකින් යුක්ත වූ සහ විශේෂයෙන්ම යම් පොදු අධිකාරියක් වෙත යොමු කරන ලද යන දෙවර්ගයේම නිර්දේශ සැදීම
- මෙම පනත යටතේ යම් තොරතුරක් නිදහස් කරනු ලැබීම පිණිස පොදු අධිකාරිය විසින් අය කරනු ලබන ගාස්තු නිශ්චය කිරීම සඳහා සාධාරණත්වය පදනම් කොට ගෙන මාර්ගෝපදේශ නිකුත් කිරීම
- තොරතුරු නිළධාරියෙකු විසින් ගාස්තුවක් අයකිරීමෙන් තොරව තොරුතුරු ලබාදිය හැක්කේ කවර අවස්ථාවලදී ද යන්න නියම කිරීම
- තොරතුරු සැපයීම සම්බන්ධයෙන් ප්‍රගාමී හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය මත පදනම්ව ගාස්තු උපලේඛණ නියම කිරීම
- මෙම පනතේ විධිවිධාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිළධාරීන් සමඟ සාමූහිකව කටයුතු කිරීම හෝ එම නිළධාරීන් සඳහා පුහුණු කටයුතු භාරගැනීම
- මෙම පනතේ අවශ්‍යතා සහ ඒ යටතේ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රසිද්ධ කිරීම
- පොදු අධිකාරීන් සඳහා වාර්තා නිසි පරිදි පවත්වා ගැනීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම

## 2.2 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වගන්තිය අනුව කොමිෂන් සභාවේ බලතල

- පරීක්ෂණයක් පැවැත්වීම සහ එම පරීක්ෂණය සඳහා පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීම

- දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම යටතේ එම තැනැත්තා විභාග කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී එම තැනැත්තාගේ සන්තකයේ පවතින යම් තොරතුරක් සපයන ලෙස එම තැනැත්තා වෙත නියම කිරීම, එසේ වුවද 5 වන වගන්තිය යටතේ හෙළිදරව් කිරීම මුක්ත කර ඇති තොරතුරු රහසිගතව පරීක්ෂා කළ යුතුය

- මෙම පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරුනු ලබන තොරතුරු ඇතුළු පොදු අධිකාරීන් විසින් දරනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම

- ❖ යම් නිශ්චිත ආකෘතියකින් තොරතුරු සපයන ලෙස පොදු අධිකාරියක් වෙත විධාන කිරීම

- ❖ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහජනතාවගෙන් යම් පොදු අධිකාරියක් රඳවාගෙන සිටිනු ලබන තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙස එම පොදු අධිකාරිය වෙත විධාන කිරීම

- ❖ 32 වන වගන්තිය යටතේ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම සහ තීරණය කිරීම සහ ඉල්ලා සිටිනු ලැබූ තොරතුරු නියමිත වේලාවට නොලැබීම හේතුවෙන් පුරවැසියකුගෙන් අය කරනු ලැබූ ගාස්තු ප්‍රතිපූර්ණය කරන ලෙස පොදු අධිකාරියක් හෝ අදාළ තොරතුරු සැපයීමේ නිළධාරියෙකු වෙත නියෝග කිරීම

## 2.3 වත්මන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. එම නිර්දේශ ඉදිරිපත් කිරීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාව විසින් පහත සඳහන් එක් එක් සංවිධාන හෝ සංවිධාන ප්‍රභේද විසින් නම් කරනු ලබන එක් තැනැත්තකු නිර්දේශ කරනු ලැබිය යුතුය.

- ❖ (අ) නීතීඥවරයන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නීතීඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතීඥයවරයෙක් හෝ නීති විශාරදයෙක් නම් කළ යුතු ශ්‍රී ලංකා නීතීඥ සංගමය
- ❖ (ආ) ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන; සහ
- ❖ (ඇ) වෙනත් සිවිල් සමාජ සංවිධාන.

පනත සම්මත වීමෙන් පසු 2016.10.01 දින ප්‍රථම වරට පත් කරනු ලැබූ කොමිෂන් සභාවේ සභාපති ඇතුලු කොමසාරිස්වරුන්ගේ ප්‍රථම වසරක 05 ක ධුර කාලය 2021.09.21 දිනෙන් අවසන් විය.

2021.12.09 දින සිට ක්‍රියාත්මක වන වත්මන් කොමිෂන් සභාවේ සභාපති ලෙස විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න මහතා හා කොමසාරිස්වරු ලෙස විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම මහත්මිය, නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මෙය හා නීතීඥ ජගත් ලියනආරච්චි මහතා ද 2022.09.20 දින සිට පත් වූ මොහොමඩ් නහියා මහතා ද කටයුතු කරනු ලබයි.

2023.04.06 දින සිට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ඩී. සී දිසානායක මහතා කටයුතු කරනු ලබයි.

# 3. කොමිෂන් සභාවේ කාර්යය සාධනය

## 3.1 අභියාචනා ලැබීම

පනතේ 32 වන වගන්ති ප්‍රකාරව, 31(1) වගන්තිය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන් කරන ලද තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් හෝ 31(3) වගන්තිය නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත තීරණයක් ලබා දිය යුතු යම් අභියාචනාවකට තීරණය ලබා ගැනීමට නොහැකි වීමෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එසේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීමෙන් මාස දෙකක් ඇතුළත දී කොමිෂන් සභාව වෙත අභියාචනා කරනු ලැබිය හැකිය.

ඒ අනුව 2023 වන වර්ෂය තුලදි කොමිෂන් සභාව වෙත අභියාචනා 1688 ක් ලද අතර එය පූර්ව වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලද අභියාචනාවලට වඩා අභියාචනා 163 කින් වැඩි වී ඇත. 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පළාත් හා දිස්ත්‍රික්ක අනුව කොමිෂන් සභාව වෙත ලද අභියාචනා පහත පරිදි දැක්වේ.

**වගුව 1 - පළාත අනුව අභියාචනා වර්ගීකරණය**

| අංක | පළාත / වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | **2023** |
|---|---|---|---|---|---|---|---|
| 1. | උතුර | 48 | 69 | 71 | 82 | 116 | **181** |
| 2. | වයඹ | 26 | 17 | 34 | 21 | 73 | **99** |
| 3. | බස්නාහිර | 338 | 443 | 226 | 239 | 446 | **646** |
| 4. | උතුරු මැද | 43 | 30 | 16 | 21 | 60 | **74** |
| 5. | මධ්‍යම | 77 | 74 | 83 | 80 | 215 | **175** |
| 6. | සබරගමුව | 35 | 64 | 30 | 63 | 67 | **95** |
| 7. | නැගෙනහිර | 75 | 113 | 112 | 30 | 168 | **150** |
| 8. | දකුණ | 143 | 188 | 145 | 268 | 352 | **225** |
| 9. | ඌව | 15 | 31 | 12 | 21 | 28 | **43** |
| | එකතුව | 800 | 1029 | 729 | 825 | 1525 | **1688** |

**වගුව 2 - දිස්ත්‍රික්ක අනුව අභියාචනා වර්ගීකරණය**

| අංක | දිස්ත්‍රික්කය / වර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | **2023** |
|---|---|---|---|---|---|---|---|
| 1. | කොළඹ | 212 | 323 | 161 | 197 | 342 | **454** |
| 2. | ගම්පහ | 91 | 73 | 52 | 30 | 71 | **136** |
| 3. | කලුතර | 35 | 47 | 13 | 12 | 33 | **56** |
| 4. | ගාල්ල | 90 | 113 | 58 | 47 | 96 | **134** |
| 5. | මාතර | 21 | 44 | 29 | 14 | 59 | **48** |
| 6. | හම්බන්තොට | 32 | 31 | 58 | 207 | 197 | **43** |
| 7. | මහනුවර | 63 | 49 | 54 | 67 | 104 | **117** |
| 8. | මාතලේ | 13 | 12 | 3 | 6 | 13 | **22** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9. | නුවර එළිය | 2 | 13 | 26 | 9 | 98 | **36** |
| 10. | ත්‍රිකුණාමලය | 6 | 12 | 5 | 17 | 16 | **27** |
| 11. | මඩකලපුව | 7 | 25 | 12 | 12 | 12 | **24** |
| 12. | අම්පාර | 61 | 76 | 95 | 51 | 140 | **99** |
| 13. | යාපනය | 26 | 49 | 44 | 41 | 62 | **77** |
| 14. | වව්නියාව | 15 | 10 | 6 | 4 | 19 | **38** |
| 15. | මන්නාරම් | 5 | 2 | 3 | 5 | 9 | **16** |
| 16. | කිලිනෝච්චිය | 1 | 5 | 1 | 3 | 10 | **18** |
| 17. | මුලතිව් | 1 | 3 | 17 | 10 | 16 | **32** |
| 18. | කුරුණෑගල | 19 | 54 | 18 | 10 | 41 | **40** |
| 19. | පුත්තලම | 7 | 23 | 16 | 11 | 32 | **59** |
| 20. | අනුරාධපුරය | 35 | 14 | 11 | 14 | 32 | **30** |
| 21. | පොලොන්නරුව | 7 | 16 | 5 | 7 | 28 | **44** |
| 22. | කෑගල්ල | 6 | 20 | 9 | 3 | 17 | **20** |
| 23. | රත්පුරය | 29 | 44 | 21 | 27 | 50 | **75** |
| 24. | බදුල්ල | 6 | 19 | 9 | 3 | 15 | **26** |
| 25. | මොනරාගල | 10 | 12 | 3 | 18 | 13 | **17** |
| | එකතුව | 800 | 1089 | 729 | 825 | 1525 | **1688** |

2018 සිට 2023 දක්වා කොමිෂන් සභාව වෙත ලද අභියාචනා පිළිබඳ සැළකිමේදී සෑම වර්ෂයකම මෙන්ම වැඩි අභියාචනා ගණනක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතෙන් වන අතර 2022 වර්ෂය හා සැසඳීමේදී එය සංඛ්‍යාත්මක වශයෙන් අභියාචනා 200 ක වර්ධනයකි. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක අතුරින් සෑම වර්ෂයකම කොළඹ දිස්ත්‍රික්කයෙන් යොමුවන අභියාචනා ඉහළ අගයක් ගන්නා අතර එය 2022 වර්ෂය සැසඳීමේදී සංඛ්‍යාත්මක අභියාචනා 112 ක වර්ධනයකි.

තවද 2022 වර්ෂයේ සැසඳීමේදී 2023 වර්ෂයේ සමස්ත අභියාචනා වර්ධනය 10.68% කි.

**වගුව 3 - 2023 වර්ෂයේ තොරතුරු මූලාශ්‍රය අනුව අභියාචනා වර්ගීකරණය**

| අංක | තොරතුරු මූලාශ්‍රය | අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| 1. | මානව සම්පත් කළමනාකරණය | 228 |
| 2. | ඉඩම් හා දේපල | 260 |
| 3. | පරිපාලන සේවා කටයුතු | 84 |
| 4. | මූල්‍ය කළමනාකරණ සහ ගිණුම් | 33 |
| 5. | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | 52 |
| 6. | අධ්‍යාපන සේවය | 81 |
| 7. | පාරිසරික බලපෑම් | 15 |
| 8. | විභාග, විමර්ෂණ කමිටු වාර්තා | 67 |
| 9. | සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ කරුණු | 20 |
| 10. | නීතිය හා සාමය | 102 |
| 11. | ප්‍රසම්පාදන | 16 |

| | | |
|---|---|---|
| 12. | පොදු කරුණු | 387 |
| 13. | විවිධ තොරතුරු ඉල්ලීම් | 343 |
| | මුළු ගණන | 1688 |

**වගුව 4 – 2023 වර්ෂයේ පොදු අධිකාරීන් අනුව අභියාචනා වර්ගීකරණය**

| අංක | පොදු අධිකාරිය | අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | ආණ්ඩුවේ අමාත්‍යාංශ | 361 |
| (ආ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරණ සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩල හෝ කාර්යාල | 702 |
| (ඇ) | ආණ්ඩුවේ දෙපාර්තමේන්තු | 207 |
| (ඈ) | රාජ්‍ය සංස්ථා | 30 |
| (ඉ) | සිය කොටස්වලින් 25% ක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අනන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගම් | 10 |
| (ඊ) | පළාත් පාලන ආයතන | 176 |
| (උ) | ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලන ආයතයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක්, බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සීමාවූ පෞද්ගලික හිමිකාරිත්වයක් හෝ සංවිධාන | 27 |
| (ඌ) | පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතන | 144 |
| (එ) | මහජනතාව වෙත සේවයක් ලබාදෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබාදෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇතිකරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයක් අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන | 05 |
| (ඒ) | යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබාදෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇතිකරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මුල්‍යාධාර සපයන පෞද්ගලික විශ්ව විද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන | 18 |
| (ඔ) | යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබාදෙනු ලබන හෝ රජය මගින් රාජ්‍ය සංස්ථාවක් | 03 |

| අංක | පොදු අධිකාරිය | අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| | මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හේ අර්ධ වශයෙන් මුල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබාදෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන | |
| (ඕ) | යුක්තිය පසඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන | 05 |
| | එකතුව | 1688 |

**වගුව 5 – 2023 වර්ෂයේ භාෂාව අනුව ලද අභියාචනා**

| භාෂාව | අභියාචනා සංඛ්‍යාව |
|---|---|
| සිංහල | 1149 |
| දෙමළ | 257 |
| ඉංග්‍රීසි | 282 |
| එකතුව | 1688 |

## 3.2 අභියාචනා විභාග කිරීම

2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා කොමිෂන් සභාව වෙත අභියාචනා 1688 ක් ලැබුණි. 2022 වර්ෂයේ ලැබුණු අභියාචනා අතුරින් අභියාචනා 414 ක් එම වර්ෂය තුළ විභාග කිරීමට නොහැකිවූ බැවින් 2023 වර්ෂයේදි විභාග කිරීම සඳහා ඇතුළත් කෙරුණි.

ඒ අනුව 2023 වර්ෂයේදී විභාගකිරීමට නියමිත වූ මුළු අභියාචනා සංඛ්‍යාව 2102 විය. මේ අතරින් අභියාචනා 1324 විභාගයට ගනු ලැබූ අතර කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබූ ඌණතා සහිත අභියාචනා සංඛ්‍යාව 227 ක් විය. එමෙන්ම අඩක් විභාගකර ඉදිරි වර්ෂයට දින නියම කරන ලද අභියාචනා 64 ක් ද බහාතබන ලද අභියාචනා 21 ක් 2023 වර්ෂයේ විභාගයට ගැනීමට නොහැකිව 2024 වර්ෂයේ විභාග සඳහා දින නියමකළ අභියාචනා 466 ක් වශයෙන් උක්ත සම්පූර්ණ අභියාචනා සංඛ්‍යාව සමන්විත විය.

තවද 2023 වර්ෂයට පෙර සිට විභාග කරගෙන පැවති අභියාචනා ද ඇතුළත්ව 2023 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් අවසන් නියෝග නිකුත් කරනු ලැබූ අභියාචනා සංඛ්‍යාව 1500 විය. මෙම සියලුම අභියාචනාවල නියෝග කොමිෂන් සභා වෙබ් අඩවියට උඩුගත කර ඇත.

**වගුව 6 – 2023 වර්ෂයේ අභියාචනා විභාග කිරීම (2023.01.01 දින සිට 2023.12.31 දක්වා)**

| ලැබූ අභියාචනා | සංඛ්‍යාව | විභාගකල අභියාචනා | සංඛ්‍යාව |
|---|---|---|---|
| පෙර වර්ෂයෙන් පරීක්ෂණ සඳහා ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව | 414 | 2023 වසරේ විභාග කර ඇති මුළු අභියාචනා සංඛ්‍යාව | 1324 |
| 2023 වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලැබුණු මුළු අභියාචනා සංඛ්‍යාව | 1688 | කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබූ ඌණතා සහිත අභියාචනා / පැමිණිලි සංඛ්‍යාව | 227 |
| | | අඩක් අසා නැවත විභාග කිරීම සඳහා දින නිකුත් කරන ලද අභියාචනා සංඛ්‍යාව | 64 |
| | | බහාතබන ලද අභියාචනා සංඛ්‍යාව | 21 |
| | | 2024 වර්ෂයේ ඉදිරියට ගෙන ගිය අභියාචනා සංඛ්‍යාව | 466 |
| **මුළු අභියාචනා සංඛ්‍යාව** | **2102** | **මුළු අභියාචනා සංඛ්‍යාව** | **2102** |
| 2023 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් විභාග කොට අවසන් නියෝග නිකුත් කරන ලද මුළු අභියාචනා සංඛ්‍යාව ( ඌණතා සහිත අභියාචනා සඳහා දෙන ලද නියෝග ද ඇතුළුව) | | | **1551** |

2017.02.03 දින පළකරන ලද අංක 2004/66 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ‘‘තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභා රීති 2017’’ යන මැයෙන් පළකරන ලද රීතීන්හි අංක 20 දරණ රීතියෙහි ඇතුළත් කාර්‍ය පටිපාටියට අනුකූලව සියලුම අභියාචනා 2023 වර්ෂය තුල පුද්ගලික වශයෙන් විභාග කරන ලදී. මෙම ක්‍රියාවලියේදී රීති අංක 22 ප්‍රකාරව පුද්ගලික වශයෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ නිසි බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ එම අභියාචනය සලකා බලන අවස්ථාවේදී විඩියෝ කොන්ෆරන්සින් පහසුකම් තිබුනේනම් වීඩියෝ කොන්ෆරන්සින් ක්‍රමය ඔස්සේ කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටීමට අභියාචකයින්ට හා පොදු අධිකාරින්ට අවස්ථාව ලබාදෙනු ලැබිණ. එසේම 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට බස්නාහිර පළාතේ පොදු අධිකාරින් සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටීමින් අභියාචනා විභාග කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමට තීරණය කරන ලදී. මෙම හේතුව නිසා නැවත නැවත අභියාචනා කල් තැබීමකින් තොරව ඉක්මනින් තීන්දු ලබාදීමට හැකියාවක් ඇතිවිය.

2022 වර්ෂයේ මෙන්ම 2023 වර්ෂයේද කොමිෂන් සභාව විසින් අභියාචනා විභාග අවසන්වූ විගස අවශ්‍යතාවය පරිදි ලිඛිත නියෝග ලබාදෙනු ලැබිණ. එසේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ කාර්යයන් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටුකිරීමට ඉහළ දායකත්වයක් ලබාදුන් අතර කොමිෂන් සභාවේ තැපැල් වියදම පෙර වසරවලට වඩා අවම කරගැනීමට හැකිවිය.

# 4. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ දේශීය හා ජාත්‍යන්තර මැදිහත්වීම

## 4.1 දේශීය මැදිහත්වීම

### 4.1.1 රජයේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පනතේ 14 (ඊ) වගන්තිය ප්‍රකාරව ඇති කාර්‍යය සහ කර්තව්‍ය යටතේ මෙම පනතේ විධිවිධාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සමඟ සාමූහිකව කටයුතු කිරීම හෝ එම නිලධරයන් සඳහා පුහුණු කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ, AFRIEL තරුණ ජාලය හා ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයයේ (SLPI) අරමුදල් දායකත්වය ඇතිව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂයේදී සියලුම පළාත් සභා හා ඒ යටතේ ඇති සියලුම ආයතන හා පළාත් පාලන ආයතනවල නම් කළ නිළධාරීන්, තොරතුරු නිලධාරීන් හා විෂය නිලධාරීන් ප්‍රායෝගික වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක අවශ්‍යතාවක් ඇති බව පෙනී ගිය අතර ඒ අනුව 2023 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් පළාත් සභා හා ඒ යටතේ පවතින සියලුම ආයතනවල තොරතුරු නිලධාරීන් හා නම් කළ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පහත පරිදි ක්‍රියාත්මත කරන ලදී.

**වගුව 7 – 2023 වර්ෂයේ රජයේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

| අංක | දිනය | දිස්ත්‍රික්කය / ස්ථානය | ඉලක්කගත කණ්ඩායම / සහභාගිත්වය | අරමුදල් දායකත්වය |
|---|---|---|---|---|
| 1 | 2023.01.24 | කොළඹ - BMICH | ශ්‍රී ලංකා පොලිස් නිළධාරීන් සඳහා අත්පොතක් එළි දැක්වීම - 60 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 2 | 2023.06.20 | සබරගමු පළාත - සබරගමු පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරින් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 120 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 3 | 2023.07.04 | මධ්‍යම පළාත - මධ්‍යම පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරින් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 190 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 4 | 2023.08.22 | උතුරු මැද පළාත - උතුරු මැද පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරින් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 150 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 5 | 2023.09.05 | නැගෙනහිර පළාත - නැගෙනහිර පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරින් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 178 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |

| අංක | දිනය | දිස්ත්‍රික්කය / ස්ථානය | ඉලක්කගත කණ්ඩායම / සහභාගිත්වය | අරමුදල් දායකත්වය |
|---|---|---|---|---|
| 6 | 2023.09.26 | දකුණු පළාත - දකුණු පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරීන් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 241 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 7 | 2023.10.10 | ඌව පළාත - ඌව පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරීන් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 225 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 8 | 2023.11.07 | වයඹ පළාත - වයඹ පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරීන් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 250 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |
| 9 | 2023.11.28 | උතුරු පළාත - උතුරු පළාත් සභා සංකීර්ණය | පොදු අධිකාරීන් වල නම් කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් - 140 | රජයෙ අරමුදල්/AFRIEL තරුණ ජාලය |

වගුව **08- 2023 සිවිල් සංවිධාන දැනුවත් කිරීම**

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2023.04.01 | හම්බන්තොට - දෙහිගහලන්ද ජාතික පාසල | තරුණ ප්‍රජාව - 150 | AFRIEL තරුණ ජාලය |
| 2 | 2023.04.08 | මහනුවර - ඩී එස් සේනානායක විද්‍යාලය | තරුණ ප්‍රජාව - 700 | AFRIEL තරුණ ජාලය |
| 3 | 2023.05.06 | වවුනියාව - උතුරු පළාත | ජනමාධ්‍යවේදීන් දැණුවත් කිරීම - 30 | SLPI |
| 4 | 2023.08.15 | මහනුවර - මධ්‍යම පළාත | පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම | SLPI |

## 4.1.2 රාජ්‍ය ආයතන සඳහා කොමිෂන් සභාව සාමාජිකයන්ගේ සම්පත් දායකත්වය

2023 වර්ෂයේදී විවිධ රාජ්‍ය ආයතන විසින් සංවිධානය කරනු ලබන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා කොමිෂන් සභාවේ සමාජිකයන් සිය සම්පත් දායකත්වය විවිධ අවස්ථාවලදී ලබාදී තිබේ.

වගුව **9 – 2023 වර්ෂයේ කොමිෂන් සභාවේ සාමාජියන් විසින් සම්පත්දායකත්වය ලබාදීම**

| අංක | පොදු අධිකාරිය / ආයතනය | වැඩසටහන | ස්ථානය | දිනය |
|---|---|---|---|---|
| 1 | ජනමාධ්‍ය අමාත්‍යාංශය | ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තොරතුරු ඒකකය සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ වැඩමුළුව | කොළඹ | 2023.01.9 - 10 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | ජනමාධ්‍ය අමාත්‍යාංශය | පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩමුළුව - දෙමළ මාධ්‍ය | වවුනියාව | 2023.03-17 - 19 |
| 3 | සිරස රූපවාහිනිය | තොරතුරු පනත පිළිබඳ සාකච්ඡාව | කොළඹ | 2023.04.21 |
| 4 | SLIT ආයතනය | තොරතුරු පනත පිළිබඳ දේශණය | කොළඹ | 2023.05.08 |
| 5 | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය | තොරතුරු නිළධාරීන් දැණුවත් කිරීමේ වැඩමුළුව | කොළඹ | 2023.06.27 |
| 6 | යාල් ටීවී රූපවාහිනී නාලිකාව | තොරතුරු පනත පිළිබඳව දැනුවත් කිරීම | කොළඹ | 2023.09.20 |
| 7 | අග්‍රාමාත්‍ය කාර්යාලය | නිළධාරීන් දැණුවත් කිරීමේ වැඩමුළුව | කොළඹ | 2023.10.02 |

### 4.1.3 ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම

2023 වර්ෂය තුළ ජාත්‍යයන්තර මුල්‍ය අරමුදල විසින් එහි ශ්‍රී ලංකා ආර්ථික සමාලෝචන ක්‍රියාවලියට 2023 වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබූ වාර්තාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම කොමිෂන් සභාවේ කටයුතු ඇතුළත්කර තිබූ අතර ජාත්‍යන්තර මුල්‍ය අරමුදල විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත හා වර්තමාන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලබන කාර්‍යභාරය පිළිබඳ ධනාත්මක ප්‍රතිචාරයක් ඇතුළත්කර තිබුණි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ශක්තිමත් කිරීම පිණිස ජාත්‍යයන්තර මුල්‍ය අරමුදලේ යෝජනා අතුරින් කොමිෂන් සභාව වෙත පැවරෙන සෘජු වගකීමක් ලෙස ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීමේ ක්‍රියාවළිය ශක්තිමත් කිරීම සඳහා 2023 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් කටයුතු ආරම්භ කළ අතර ඒ අනුව අමාත්‍ය මණ්ඩලයට අයත් සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන් (නම්කළ නිළධාරීන්) හා තොරතුරු නිළධාරීන් සඳහා එක්දින දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023 දෙසැම්බර් මස 19 වන දින දී කොළඹදී පවත්වන ලදී.

## 4.2 ජාත්‍යන්තර සම්මන්ත්‍රණ

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් මගින් සංවිධානය කරන වැඩසටහනකට කරන ලද ආරාධනාවක් අනුව නේපාලයේ ජාතික තොරතුරු කොමිෂන් සභාවේ කාර්යාලය නිරීක්ෂණය කිරීම සඳහා මෙම කොමිෂන් සභවේ සභාපතිවරයාට හා කොමසාරිස්වරුන්ට 2023 මැයි මස 24 සිට 29 අතර කාලයේ නේපාලයේ සංචාරය කිරීමට අවස්ථාව ලැබිණි.

මෙහිදී යුක්තිය උදෙසා පිවිසෙන අවස්ථාවන් වැඩිදියුණු කිරීම, තොරතුරු පිළිබඳ අයිතිවාසිකම හා නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම යන කරුණුවලට අදාළව සහයෝගිතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා නේපාල තොරතුරු කොමිෂන් සභාව මගින් ආරාධනාවක් ලැබිණි. මෙම සංචාරයේදී නේපාලයේ ජාතික තොරතුරු කොමිෂම, මානව හිමිකම් කොමිෂන් සභාව, නේපාලයේ මාධ්‍ය ප්‍රජාව නිතිඥ සංගමය සිවිල් සමාජ සංවිධාන විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්‍ය මණ්ඩලය, තොරතුරු අයිතිවාසිකම පිළිබඳ කටයුතු කරනු ලබන කලාපීය හා දිස්තික් රාජ්‍ය ආයතන සමඟ අදහස් හුවමාරු කර ගැනීමට හැකිවීම කලාපේ සම ආයතන දෙකක් අතර අත්දැකීම් හා අදහස් හුවමාරු කර ගැනීමට ලද මාහැඟි අවස්ථාවක් වන්නේය.

2023 ජූනි 20 – 23 දිනවල මැනිලා නුවර පැවති තොරතුරු කොමසාරිස්වරුන්ගේ ජාත්‍යයන්තර සමුළුවේදි (ICIC) 14 වන සංස්කරණය සඳහා ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව වෙත කරන ලද ආරාධනාවකට අනුව කොමිෂන් සභාව නියෝජනය කරමින් කොමසාරිස් කිශාලි පින්ටෝ ජයවර්ධන මෙයට සහභාගි වූ අතර එහිදි ඇය ‘‘විශ්වීය වශයෙන් අභියෝගාත්මක යුගයක’’ යන මැයෙන් සමාරම්භක සැසියේදි දේශනයක් කරන ලදි. තොරතුරු දැනගැනීමේ අනාගතය යන කතිකාවත් සමඟ ලතින් ඇමරිකානු, උතුරු ඇමරිකානු අප්‍රිකානු යුරෝපා සහ ඔස්ට්‍රේලියාව - සාගරික තොරතුරු ජාලයන්හි ගෝලීය රැස්වීම්වලට සම්බන්ධ තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ ආසියානු සංවිධානය (AAIA) පිහිටුවීමේ සම - ප්‍රධානියා ලෙසට ද එම රැස්වීමේදි ඇයව තෝරාගන්නා ලදී.

## 5. කොමිෂන් සභාවේ අධිකරණ කටයුතු

කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණවලට අතෘප්තියට පත්වූ යම් පුරවැසියෙකු හෝ පොදු අධිකාරියක් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව එම තීරණයට එරෙහිව, එම තීරණය දැනුම් දුන් දින සිට මාසයක් ඇතුළත අභියාචනාධිකරණයට වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැක.

ඒ අනුව 2023 වර්ෂයේදී අභියාචනා අධිකරණයට පහත දැක්වෙන පුරවැසියන් හා පොදු අධිකාරීන් යොමු වී ඇත.
**වගුව 9 –** 34 වන වගන්තියට අනුව අභියාචනාධිකරණයේ ඇති නඩු - 2023 වර්ෂයට අදාළව

| අනු අංකය | අභියාචනාධිකරණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/ Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුවන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 1 | CA/RTI/01/2023 | 580/2021 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1. අන්තර් සමාගම් සේවක සංගමය (Inter Company Employees' Union)<br>2.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.01.16 ප්‍රතිවිරෝධතා |
| 2 | CA/RTI/02/2023 | 1283/2019 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 1. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2. සී.ජේ.විජයවර්ධන මහතා | 2024.03.11 විවාදය |
| 3 | CA/RTI/03/2023 | 713/2022 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 1.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2.ජී.සුරේන්දන් මහතා | 2024.03.12 විවාදය |
| 4 | CA/RTI/04/2023 | 703/2022 / 707/2022 / 708/2022 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 1.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2.ජී.සුරේන්දන් මහතා | 2024.03.12 විවාදය |
| 5 | CA/RTI/05/2023 | 2272/2023 | මහජන බැංකුව | 1.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2.එම්.එච්.එස්.විජේසේකර මහතා | 2024.02.09 විවාදය |
| 6 | CA/WRIT/63/2023 | 922/2022 | නාගානන්ද කොඩිතුවක්කු මහතා | 1.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සහ තවත් අය | 2023.04.03 වන දින අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට යටත්ව |

| අනු අංකය | අභියාචනාධිකරණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/ Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුවන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| | | | | | නිෂ්ප්‍රභා කරන ලදී. |
| 7 | CA/WRIT/200/2023 | 448/2022 | වෛද්‍ය කුමාරසිරි මානගේ මහතා | 1.රුක්ෂාන් ප්‍රනාන්දුපුල්ලේ, සභාපති, පශ්චාද් වෛද්‍ය උපාධි ආයතනය සහ තවත් 54 දෙනෙකු<br>2.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව (56 වන වගඋත්තරකරු) | මෙම නඩුවේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පාර්ශවයක් කර නොමැත. |
| 8 | CA/WRIT/223/2023 | 1108/2019 සහ 1114/2019 | CHEC Port City Colombo (Pvt) Ltd | 1. එම්.එෆ්.ඒ.මන්සූර් මහතා<br>2. Center for Environmental Justice (Guarantee) Ltd<br>3. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සහ තවත් 12 දෙනෙකු | 2024.01.26 විවාදය |
| 9 | CA/RTI/06/2023 | 1108/2019 සහ 1114/2019 | CHEC Port City Colombo (Pvt) Ltd | 1. එම්.එෆ්.ඒ.මන්සූර් මහතා<br>2. Center for Environmental Justice (Guarantee) Ltd<br>3.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සහ තවත් 12 දෙනෙකු | 2024.01.10 කැඳවීම |
| 10 | CA/RTI/07/2023 | 815/2021 | ශ්‍රී ලංකා නීතිඥ සංගමය | කමල් විතානගේ මහතා | මෙම නඩුවේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පාර්ශවයක් කර නොමැත |
| 11 | CA/RTI/08/2023 | 17/2023 | ශ්‍රී ලංකා නාවික හමුදාව - (වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා) | 1.ඒ.ඒ.එම්.රිෆ්ති අලි මහතා<br>2.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.02.06 නොතීසි වාර්තා |

| අනු අංකය | අභියාචනාධිකරණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/ Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුවන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 12 | CA/RTI/09/2023 | 1200/2022 | මහජන බැංකුව | 1.තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2. ඩී.සරත්චන්ද මහතා | 2024.02.06 කැඳවීම |
| 13 | CA/RTI/10/2023 | 1111/2022 | බී.නිරෝෂ්කුමාර් මහතා | ශ්‍රී ලංකා යුධ හමුදාව | මෙම නඩුවේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පාර්ශවයක් කර නොමැත |
| 14 | CA/RTI/11/2023 | 444/2023 | තරිඳු ජයවර්ධන මහතා | මහජන ආරක්ෂණ අමාත්‍යාංශය | මෙම නඩුවේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව පාර්ශවයක් කර නොමැත |

වගුව 10 – 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කොමිෂන් සභාව විසින් ලබා දුන් තීරණවලට එරෙහිව පනතේ 34 වන වගන්තියට අනුව අභියාචනාධිකරණයේ පවරා ඇති නඩු සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

**වගුව 10 –** 2018 වර්ෂයේ සිට 2022 දක්වා 34 වන වගන්තියට අනුව අභියාචනාධිකරණයේ විභාග වූ නඩු -

2018 වර්ෂය

| අනු අංකය | අභියාචනාධිකරණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 1 | CA/RTI/01/ 2018 (REV) | 58/2018 | මහජන බැංකුව | 1. ලංකා බැංකු සේවක සංගමය (Ceylon Bank Employees' Union) | 2020.10.13 දින අභියාචනය නිශ්ප්‍රභා කරන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | |
| 2 | CA/RTI/02/ 2018 | 117/2018 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2.වී.වයි.සභාරත්නම් මහතා | 2019.08.11 දින පෙත්සම්කරු විසින් අභියාචනය ඉවත්කරගන්නා ලදී. |
| 3 | CA/RTI/03/ 2018 | 25/2018<br>26/2018 | මුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව | 1. Verite Research (Pvt) Ltd<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.01.16 විවාදය. අධිකරණය විසින් තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව නඩු කාර්යය පටිපාටියෙන් මුදාහැර ඇත. |

2019 වර්ෂය

| අනු අංකය | අභියාචනාධික රණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 1 | CA/RTI/01/ 2019 (REV) | 06/2017 | ඊ.එම්.එස්.බී. ඒකනායක මහතා | 1. Transparency International Sri Lanka<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සහ තවත් අය | 2024.01.31 විවාදය<br><br>අධිකරණය විසින් තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව නඩු කාර්යය පටිපාටියෙන් මුදාහැර ඇත. |
| 2 | CA/WRI52/ 2019 | 97/2017 | එස්.එම්. මනෝජ් ප්‍රසන්න මහතා | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2023.03.26 දින අභියාචනය නිශ්ප්‍රභා කරන ලදී. |

2020 වර්ෂය

| අනු අංකය | අභියාචනාධික රණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 1 | CA/RTI/01/ 2020 (REV) | 766/2018 | හේවා බද්දගේ ගුණරත්න මහතා | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.01.12 විවාදය |

2021 වර්ෂය

| අනු අංකය | අභියාචනාධික රණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 1 | CA/RTI/01/ 2021 (REV) | 869/2019 | ඒ.ඒ.එල් ද අල්විස් මහතා | තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2021.12.01 දින නඩු කටයුතු අවසන්කර ඇත. |
| 2 | CA/RTI/02/ 2021 | 1193/2019 | මහජන බැංකුව | 1. ඩබ්.ඒ.ධම්මික ප්‍රනාන්දු මහතා<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.01.22 විවාදය |
| 3 | CA/RTI/03/ 2021 | 1193/2019 | ඩබ්.ඒ. ධම්මික ප්‍රනාන්දු මහතා | 1. මහජන බැංකුව<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.01.22 කරුණු තහවුරු කිරීම. |
| 4 | CA/RTI/04/ 2021 | 719/2018 | කේ.ඒ. රෝහණධීර මහතා<br>ධම්මික දිසානායක මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | චාමර සම්පත් මහතා සහ තවත් අය | 2023.02.28 දින තීන්දුව ලබා දී ඇත. එහිදී අභියාචනාධිකරණය තීන්දු කළේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිමකම පිළිබඳ පනත, |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය අභිබවා ක්‍රියත්මක වන බවයි. |
| 5 | CA/RTI/05/ 2021 | 2068/2020 | ලංකා බැංකුව | 1. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2. එස්.එම්.පසන්සනී අනුරාධා මිය | 2024.01.09 විවාදය |

2022 වර්ෂය

| අනු අංකය | අභියාචනාධික රණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 1 | CA/RTI/01/ 2022 | 416/2021 | ලංකා බැංකුව | 1. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2. ඒ.රාජපක්ෂ මහතා | 2024.01.12 නොතීසි වාර්තා (02 වන වගඋත්තරකරු) |
| 2 | CA/RTI/02/ 2022 | 201/2021 | ලංකා බැංකුව | 1. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2. රන්ජන් සේනානායක මහතා<br>3. ලංකා බැංකු සේවක සංගමය (Ceylon Bank Employees' Union) | 2022.09.06 වන දින පෙත්සම්කරු විසින් අභියාචනය ඉවත් කරගෙන ඇත. |
| 3 | CA/RTI/03/ 2022 | 610/2021 | කොළඹ මහ නගර සභාව | 1. එම්.ජී.නන්දන කුමාර මහතා<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.01.12 විරෝධතා |

| අනු අංකය | අභියාචනාධික රණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 4 | CA/RTI/04/ 2022 | 600/2021 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | 1. ලයනල් දිසානායක මහතා<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | 2024.02.27 විවාදය |
| 5 | CA/RTI/05/ 2022 | 72/2021 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | අයි.පී.එදිරිබන්දු මහතා | 2024.01.31 තීන්දුව |
| 6 | CA/RTI/06/ 2022 | 448/2022 | මහාචාර්ය සේනක රාජපක්ෂ මහතා | 1. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව<br>2. වෛද්‍ය කුමාරසිරි මානගේ මහතා | 2024.01.24 නොතීසි වාර්තා |
| 7 | CA/RTI/07/ 2022 | 647/2022 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 1. ඒ.ඒ.එම්.රිෆ්ති අලි මහතා<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව | අධිකරණය විසින් 2023.04.04 වන දින තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව නඩු කාර්යය පටිපාටියෙන් මුදාහැර ඇත.<br><br>2024.01.23 විවාදය |
| 8 | CA/RTI/08/ 2022 (REV) | 704/2021 | ලිට්‍රෝ ගෑස් ලංකා සිමාසහිත සමාගම සහ ලිට්‍රෝ ගෑස් ලංකා ටර්මිනල්ස් (පෞද්ගලික) සමාගම | 1. ඩබ්.කේ.එස්.කරුණාරත්න මහතා<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සහ තවත් අය | 2024.01.08 විවාදය |

| අනු අංකය | අභියාචනාධික රණයේ නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය - RTIC/Appeal | අභියාචක (පෙත්සම්කරු) | වගඋත්තරකරුන් | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|---|
| 9 | CA/RTI/09/ 2022 | 704/2021 | ලිට්‍රෝ ගෑස් ලංකා සිමාසහිත සමාගම සහ ලිට්‍රෝ ගෑස් ලංකා ටර්මිනල්ස් (පෞද්ගලික) සමාගම | 1. ඩබ්.කේ.එස්.කරුණාරත්න මහතා<br>2. තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව සහ තවත් අය | 2024.01.08 විරෝධතා |

2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව 38 (1) වගන්තිය අනුව පොදු අධිකාරින්හි නිළධාරින් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විනය බලධාරින් දැණුවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නැත.

2016 අංක 12 දරණ කොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව 39 (1) (ඉ) වගන්තියට අනුව 2023 වර්ෂයේ සිට කොමිෂන් සභාව විසින් ගනු ලැබූ නියෝග පිලිපදිනු නොලැබූ පොදු අධිකාරින්හි නම්කළ නිළදාරින් හා තොරතුරු නිළධාරින්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකාරණයේ නඩු පැවරීමට කටයුතු සිදුකර ඇති අතර ඒ පිළිබඳව විස්තර පහත දැක්වේ.

වගුව 11 – 2023 වසරේ 39 වන වගන්තියට අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩු

| අනු අංක | නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය | පොදු අධිකාරිය | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|
| 1. | 88513/01 | RTIC/App/855/ 2021 | වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය | 2024.01.11 දින 2 වැනි චූදිත වෙනුවෙන් ලිඛිත දේශන ගොනු කිරීම. |
| 2. | 88514/01 | RTIC/App/2081/ 2020 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 2024.01.26 දින ප්‍රතිවිරෝධතා ගොනු කිරීම, සංශෝධිත පැමිණිල්ල හා සංශෝධිත චෝදනා පත්‍රය ගොනු කිරීම. |
| 3. | 88515/01 | RTIC/App/152/ 2021 | නාගරික සංවර්ධන අධිකාරිය | 2024.01.30 දින පැමිණිලිකාර කොමිෂන් සභාවේ ස්ථාවරය දැනුම් දීම. |

| අනු අංක | නඩු අංකය | කොමිෂන් සභාවේ අභියාචනා අංකය | පොදු අධිකාරිය | ඉදිරි දිනය හා පියවර |
|---|---|---|---|---|
| 4. | 87661/01 | RTIC/App/290(B)/ 2021 | අධ්‍යාපන අමාත්‍යාංශය | 2024.03.05 දින සංශෝධිත චෝදනා පත්‍රය ගොනු කිරීම හා සංශෝධිත පැමිණිල්ල ගොනු කිරීම සහ විභාගය |
| 5. | 87662/01 | RTIC/App/1959/ 2020 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 2024.01.30 දින සංශෝධිත චෝදනා පත්‍රය ගොනු කිරීම හා සංශෝධිත පැමිණිල්ල ගොනු කිරීම. |
| 6. | 85399/01 | RTIC/App/1720/ 2019 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2023.05.02 දින නඩු කටයුතු අවසන් වී ඇත |
| 7. | 86149/01 | RTIC/App/333/ 2021 | කැළණිය විශ්ව විද්‍යාලය | 2023.11.09 දින නඩුව නිශ්ප්‍රභා වී ඇත |

**පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තිරණය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ පරීක්ෂණ**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39(1) අ,ආ,ඇ,ඉ වගන්ති ප්‍රකාරව වරදක් කරනු ලබන සෑම තැනැත්තෙකුටම එරෙහිව අපරාධ නඩු පැවරීමක් කොමිෂන් සභාව විසින් ආරම්භ කළ යුතුය. ඒ අනුව එසේ නඩු කටයුතු ආරම්භ කිරීමට පෙර කොමිෂන් සභාව විසින් කැදවනු ලැබූ තීරණයට අනුකූල නොවීමේ පරීක්ෂණ වලට අදාළ 2023 වර්ෂයට අදාළ විස්තර පහත පරිදි වේ.

වගුව 12 – 2023 වර්ෂයේ පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තිරණය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ පරීක්ෂණ

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 1 | 975/2021 | 01/2023 | එස්.පී.වයි. එම්.ධම්මික | ශ්‍රී ලංකා රේගුව | පොදු අධිකාරිය විසින් අභියාචක ඉල්ලා ඇති තොරතුරු ප්‍රමාණවත් අයුරින් මුදා හැර ඇති බවට කොමිෂන් සභාව තීරණය කරන ලදි. ඒ අනුව පරීක්ෂණය අවසන් කර ඇත. |
| 2 | 894/2021 | 02/2023 | කේ.ඒ.එස්. පී. කලුආරච්චි | කාර්මික තාක්ෂණ ආයතනය | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේදී පොදු අධිකාරිය විසින් අභියාචක වෙත භාර දෙනු ලබයි. සියලුම තොරතුරු අභියාචක වෙත ලැබී ඇති බවට කොමිෂන් |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | සභාව තීරණය කර පරීක්ෂණය අවසන් කර ඇත. |
| 3 | 801/2022 | 03/2023 | සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් සේවක සංගමය | මාර්ග සංවර්ධන අධිකාරිය - දකුණු පළාත | ඉදිරිපත්ව ඇති කරුණු අනුව පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් අයුරින් කොමිෂන් සභාවේ තීරණය ක්‍රියාත්මක කර ඇති බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 4 | 828/2021 | 04/2023 | පී.අබේගුණවර්ධන | මාර්ග සංවර්ධන අධිකාරිය | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි අභියාචක වෙත තොරතුරු සපයා ඇති බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 5 | 937/2022 | 05/2023 | එන්.ප්‍රියංකර උබයසේකර | ගොවිජන සංවර්ධන අධිකාරිය | අභියාචක ඉල්ලා ඇති තොරතුරු පිළිබඳ තීරණයක් පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීමට පොදු අධිකාරියට හැකියාවක් නොමැති බව පෙනී යයි. එමෙන්ම තොරතුරු පොදු අධිකාරියේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇත්ද යන්න ගැටලුව පැන නැගි බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 6 | 1082/ 2022 | 06/2023 | එස්.එන්.පී. කුමාර | කලාප අධ්‍යාපන කාර්යාලයේ - රත්නපුර | පොදු අධිකාරිය විසින් තොරතුරු සැපයීම සඳහා කාලය ඉල්ලා සිටී. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 7 | 689/2022 | 07/2023 | ජී.එන්.එස්. හිමාලි | කලාප අධ්‍යාපන කාර්යාලයේ - අම්බලංගොඩ | අභියාචක ඉල්ලා ඇති තොරතුරු තමන් වෙත ලැබී ඇති බවට දන්වමින් පරීක්ෂණය අවසන් කර ගැනීමට ඉල්ලීමක් කරනු ලබයි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 8 | 870/2022 | 08/2023 | එස්. සිවකුමාරන් | කලාප අධ්‍යාපන | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ලැබුනු බව පවසමින් පරීක්ෂණය අවසන් කිරීමට |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | කායාලය- හැටන් | ඉල්ලීමක් කර සිටී. එබැවින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 9 | 871/2022 | 09/2023 | එස්. සිවකුමාරන් | කලාප අධ්‍යාපන කායාලය - හැටන් | දෙපාර්ශවයම පැමිණ නොමැති බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 10 | 586/2022 | 10/2023 | ඒ. දයානන්ද | කලාප අධ්‍යාපන කායාලය - හොරණ | පොදු අධිකාරිය විසින් පරීක්ෂණය සඳහා දිනයක් ඉල්ලා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 11 | 1121/ 2022 | 11/2023 | සී. මිහිදුකුලසූරිය | ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වෙමින් නිසි පරිදි තොරතුරු සැපයීමක් සිදු කර ඇති බවට පැහැදිලි බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 12 | 703/2021 | 12/2023 | කමල් විතානගේ | ශ්‍රී ලංකා පොලිසිය | අභියාචක ඉල්ලා ඇති තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේදී අභියාචක වෙත භාර දෙනු ලබයි. තොරතුරු සැපයීම ප්‍රමාණවත් බවට අභියාචක පිළිගන්නා බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 13 | 911/2022 | 13/2023 | සර්ගා සුරන්ජන් | අධ්‍යාපන අමාත්‍යාංශය | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරිය විසින් ලබා දී ඇති තොරතුරු ප්‍රමාණවත් බවට පෙනී යන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 14 | 953/2022 | 14/2023 | එස්. සත්‍යසීලන් | අධ්‍යාපන අමාත්‍යාංශය | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරියෙහි සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බවට තීරණය කරමින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 15 | 174/2021 | 15/2023 | යල්වෙල පඤ්ඤාසේකර හිමි | අධ්‍යාපන අමාත්‍යාංශය | අභියාචක දිනපතා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 16 | 399/2022 | 16/2023 | එස්.ඒ.ඩී.පී. ඩබ්. ජයවර්ධන | ජාතික පොලිස් කොමිෂම | අභියාචක ඉල්ලා ඇති තොරතුරු මුදා හැර ඇති බවට පොදු අධිකාරිය විසින් කරුණු ඉදිරිපත් කරයි. මෙම කරුණු සලකා බලා පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 17 | 765/2022 | 17/2023 | ඩබ්.එම්.ඩී.බී .අබේරත්න | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | අභියාචක විසින් තමා ඉල්ලා සිටින තොරතුරු ලැබී ඇති බවත් පරීක්ෂණය අවසන් කරන ලෙසත් ඉල්ලා ඇත. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 18 | 552/2021 | 18/2023 | පී.ඩී.සී. පද්මමාලි | බලපිටිය ප්‍රාදේශීය සභාව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති වුවත් මේ සම්බන්ධ තොරතුරු අදාළ ආයතන වෙතින් රැස්කර වාර්තාවක් අභියාචක වෙත ලබා දෙයි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 19 | 1505/ 2019 | 19/2023 | පී.සී.සී. පෙරේරා | තැපැල් දෙපාර්තමේන්තුව | ඉල්ලා සිටි තොරතුරු අභියාචක වෙත ප්‍රමාණවත් අයුරින් ලැබී ඇති බවට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි. ඒ අනුව පරීක්ෂණය අවසන් කර ඇත. |
| 20 | 912/2022 | 20/2023 | ගාමිණී රත්නසිරි | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු ලබා දී ඇති බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 21 | 2179/ 2020 | 21/2023 | එම්.ඒ.එම්. ඒ.අබුබකර් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කල්මුනේ | අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බවට තහවුරු වන බැවින් මෙම |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 22 | 141/2018 | 22/2023 | එච්.ඩී.කේ .පෙරේරා | නගර සභාව පානදුර | අභියාචක දිවුරුම් ප්‍රකාශ ලබා දී නොමැත. පොදු අධිකාරිය තොරතුරු අභියාචක වෙත භාර දීම සඳහා දින පතා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 23 | 61/2018 | 23/2023 | ඊ.එම්.සී. එදිරිසූරිය | නාගරික සංවර්ධන අධිකාරිය - මහනුවර | අභියාචක මිය ගිය බවට කොමිෂන් සභාව වෙත දන්වා ඇති මුත් එය සනාත වන තොරතුරු කොමිෂන් සභාව වෙත ලැබී නොමැති බැවින් සනාථ කිරීම සඳහා උපදෙස් දෙමින් පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 24 | 76/2017 | 24/2023 | ඊ.එම්.සී. එදිරිසූරිය | නාගරික සංවර්ධන අධිකාරිය | මෙය අවසන් වී ඇති පරීක්ෂණයකි. එබැවින් මේ සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයක් අවශ්‍ය නොවන බවට තීරණය කර ඇත. |
| 25 | 611/2021 | 25/2023 | පී.කේ. චන්ද්‍රසේන | වැලිගම ප්‍රාදේශීය සභාව | අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු සම්පූර්ණ කර අභියාචක වෙත ලබා දීමට පොදු අධිකාරියෙන් කාලය ඉල්ලා ඇත. ඒ අනුව විමසීම 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 26 | 1770/ 2019 | 26/2023 | එම්. රිසාන් | පානදුර ප්‍රාදේශීය සභාව | දෙපාර්ශවයම පරීක්ෂණයට සහභාගි වී නොමැති බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 27 | 294/2021 | 27/2023 | එම්.එස්. එම්.උෂාන් | ශ්‍රී ලංකා පොලිසිය | අභියාචකගේ තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු තමා වෙත ලැබුනු බවට අභියාචක |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | පිළිගනී. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 28 | 2264/ 2020 | 28/2023 | එස්.ඒ.එස්. එස්. පෙරේරා | පොලිස් මූලස්ථානය | අභියාචක පැමිණ නොමැති බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 29 | 297/2021 | 29/2023 | ඩී. එම්. ජී. වික්‍රමරත්න | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | අභියාචක පැමිණ නොමැති බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 30 | 787/2021 | 30/2023 | එස්.ඊ. ලීලාරත්න | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව-දකුණු පළාත | පොදු අධිකාරීයේ ස්ථාවරය සම්බන්ධයෙන් එවා ඇති ලිපිය අභියාචක වෙත ලැබී නොමැති අතර එය භාර දෙනු ලැබීය. කරුණු අනාවරණය කිරීමට අභියාචක උත්සුක වී නොමැත. විකල්පයක් නොමැති බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 31 | 30/2021 | 31/2023 | ඩී.ජී.ඊ. ප්‍රනාන්දු | අධ්‍යාපන අමාත්‍යාංශය | අභියාචක පැමිණ නොමැති බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 32 | 623/2021 | 32/2023 | ජීවකුමාර් | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | පොදු අධිකාරිය විසින් දින පතා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 33 | 1619/ 2019 | 33/2023 | පී.කේ.හරිස්චන්ද්‍ර | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | අභියාචක දින පතා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 34 | 2345/ 2020 | 34/2023 | ඒ.ඩී.එෆ්. පෙරේරා | මොරටුව මහ නගර සභාව | අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු වලින් කොටසක් ලැබී ඇති බවටත් ඉතිරිය විනාශව ඇති බවට දක්වන පොදු අධිකාරියේ ස්ථාවරය අභියාචක පිළිගනී. නැවත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | අයිතියට යටත්ව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 35 | 2268/ 2020 | 35/2023 | සොයිසා සිරිවර්ධන | ශ්‍රී ලංකා යුධ හමුදාව | සම්පූර්ණ තොරතුරු මුදා හැර නොමැති බැවින් තොරතුරු මුදා හැරීමට උපදෙස් දෙමින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 36 | 430/2021 | 36/2023 | අයි. චන්ද්‍රකුමාර් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු මුදා හැරීමේ හැකියාව ඇති බවට පොදු අධිකාරිය පිළිගන්නා අතර තොරතුරු මුදා හැරීමට භාර ගෙන පරීක්ෂණය අවසන් කර ඇත. |
| 37 | 520/2022 | 37/2023 | ඒ.එම්. නසීර් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු මුදා හැරීමට හැකියාවක් ඇති බවට පොදු අධිකාරිය පිළිගනිමින් තොරතුරු මුදා හැරීමට භාර ගනී. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 38 | 969/2021 | 38/2023 | එම්.එම්. නිෆ්‍රාස් මන්සූර් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | අභියාචක වෙත ඉල්ලා ඇති තොරතුරු මුදා හැරීමට හැකියාව ඇති බවට පොදු අධිකාරිය පිළිගනී. ඒ අනුව තොරතුරු මුදා හැරීමට භාර දෙමින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 39 | 1084/ 2019 | 39/2023 | ඒ.එල්.එම්. රිසාන් | කාත්තන්කුඩි මුස්ලිම් පල්ලි සම්මේලනය සහ මුස්ලිම් ආයතනය | අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු මුදාහැර නොමැති බවට අභියාචක ප්‍රකාශ කරයි. කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වීම පැහැර හැර ඇති බැවින් 39 වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට තීරණය කරන ලදි |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 40 | 1072/ 2022 | 40/2023 | එන්.සී. අබේසේකර | ශ්‍රී ලංකා පොලීසිය - අතුරුගිරිය | පොදු අධිකාරිය විසින් අභියාචක ඉල්ලා ඇති තොරතුරු අභියාචකගේ නිතීඥ වෙත කොමිෂන් සභාව ඉදිරියේදී භාර දෙනු ලබයි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 41 | 1073/ 2022 | 41/2023 | එන්.සී. අබේසේකර | ශ්‍රී ලංකා පොලීසිය- නුගේගොඩ | පොදු අධිකාරිය විසින් අභියාචක ඉල්ලා ඇති තොරතුරු අභියාචකගේ නිතීඥ වෙත කොමිෂන් සභාව ඉදිරියේදී භාර දෙනු ලබයි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 42 | 502/2021 | 42/2023 | ආර්. කුලතුංග | නගර සභාව- දෙහිවල ගල්කිස්ස | කොමිෂන් සභාවේ තීරණය ක්‍රියාත්මක කළ බවට සනාත කෙරෙන ලේඛන කිසිවක් නොමැති බැවින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට තීරණය කර ඇත. |
| 43 | 2079/ 2020 | 43/2023 | එස්. කාරියවසම් | මාර්ග සංවර්ධන අධිකාරිය | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු සියල්ලම කොමිෂන් සභාව ඉදිරියේදී භාර දෙන ලදි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 44 | 119/2022 | 44/2023 | ආර්. කපිලන් | යාපනය විශ්ව විද්‍යාලය | අභියාචක විසින් දින පතා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 45 | 1854/ 2019 | 45/2023 | ජී.ඩී. හේමන්ත සිල්වා | ලංකා සළුසල ලිමිටඩ් | කොමිෂන් සභාවේ තීරණයට අනුව පොදු අධිකාරිය ක්‍රියා කර නොමැති බවට පෙනී යයි. ඒ අනුව තොරතුරු මුදා හැරීම සඳහා පොදු අධිකාරියට තවත් දිනයක් ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 46 | 1149/ 2019 | 46/2023 | එච්.කේ.ආර්.එන්. ඉන්ද්‍රජීත් | ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය | අභියාචක වෙත ඉල්ලා සිටින ලද තොරතුරු භාර දුන් අතර එකී තොරතුරු සැපයීමෙන් සෑහීමකට පත් වන බව ප්‍රකාශ කර සිටී. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කරන ලදි. |
| 47 | 1019/ 2021 | 47/2023 | ආර්. අමරසිංහ | තැපැල් දෙපාර්තමේන්තුව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේදී අභියාචක වෙත භාර දෙයි. අභියාචක ඉන් සෑහීමකට පත් වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 48 | 977/2021 | 48/2023 | එල්.එන්. ෆ්‍රැන්සිස් | රාජ්‍ය සේවා කොමිෂම | පොදු අධිකාරිය දක්වා ඇති කරුණු අනුව අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු අදාළ පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බවට තහවුරු වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 49 | 1928/ 2020 | 49/2023 | යූ.කිවු. ලියනආරච්චි | කම්කරු දෙපාර්තමේන්තුව | තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය එකඟ වන අතර ඒ අනුව පරීක්ෂණය අවසන් අවසන් කර ඇත. |
| 50 | 687/2021 | 50/2023 | එස්.බී. ලීලාරත්න | කලාප අධ්‍යාපන කාර්‍යාලය- මොරවක | පොදු අධිකාරිය ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කිරීම සඳහා කාලය ඉල්ලා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.01.04 දිනට කල් තබා ඇත. |
| 51 | 1117/ 2022 | 51/2023 | එම්.ඒ.එන්. නලීම් | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් අභියාචක ඉල්ලා ඇති තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේදී අභියාචක වෙත මුදා හරී. එය පරීක්ෂා කර බලා පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 52 | 631/2021 | 52/2023 | ජී.බී. විජේසිංහ | ආගමන හා විගමන | පොදු අධිකාරිය කොමිෂන් සභාවට තොරතුරු මුදා හරී. ඉල්ලීමට සෑහීමකට පත් විය හැකි තොරතුරු සැපයීමක් සිදුව ඇති |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | දෙපාර්තමේන්තුව | බවට කොමිෂන් සභාව තීරණය කරමින් එම තොරතුරු අභියාචක වෙත භාර දීමට උපදෙස් දෙමින් පරීක්ෂණය අවසන් කර ඇත. |
| 53 | 726/2021 | 53/2023 | ජෝන් විල්සන් | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් අභියාචක වෙත තොරතුරු සපයයි. අභියාචකගේ නියෝජිත තොරතුරු පරීක්ෂා කර බලා සෑහීමකට පත් වන බව ප්‍රකාශ කර සිටී. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 54 | 965/2021 | 54/2023 | කේ. ප්‍රසන්න කුමාර් | දුම්රිය දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් පරිදි තොරතුරු සපයා ඇති බවට කොමිෂන් සභාවට පෙනී යන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 55 | 198/2023 | 55/2023 | කේ.කේ. බුලත්සිංහල | නගර සභාව මහරගම | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ඉල්ලීමේ ඇතැම් අයිතමයන් සඳහා වඩා විධිමත් තොරතුරු සැපයීම සඳහා පොදු අධිකාරියෙන් කාලය ඉල්ලා සිටී. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 56 | 81/2022 | 56/2023 | කේ.කේ. බුලත්සිංහල | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාව | අභියාචක ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් අභියාචක වෙත කොමිෂන් සභාව ඉදිරියේදී භාර දෙනු ලබයි. අභියාචක සෑහීමකට පත් වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 57 | 1631/ 2019 | 57/2023 | ජේ. විල්සන් | කොළඹ මහ නගර සභාව | පොදු අධිකාරිය විසින් යථා පරිදි පැහැදිලිව කොමිෂන් සභාවේ තීරණය පරිදි ක්‍රියා කර ඇති බව කොමිෂන් සභාව තීරණය කර ඇත. ඉදිරි පියවරක් නොගැනීමට කොමිෂන් සභාව තීරණය කරයි. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 58 | 1601/ 2019 | 58/2023 | වී.ජී.එස්.සී. උබේසේකර | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | පොදු අධිකාරියෙන් දින පතා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 59 | 1269/ 2022 | 59/2023 | කේ.එස්. එල් . කනුගල | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව | පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාව ඉදිරියේ තොරතුරු අභියාචක වෙත මුදා හරින ලදි. ඒ අනුව පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 60 | 1174/ 2022 | 60/2023 | ජී. බාලචන්ද්‍රන් | අධිකරණ අමාත්‍යාංශය | මෙම ඉල්ලීම RTIC/APP NO. 1175/2022 සමග ඒකාබද්ධ කොට RTIC/APP NO.1175/2022 අභියාචනයේ තීරණය දිනයේදී සඳහන් කිරීමට තීරණය කරනු ලැබේ. |
| 61 | 1435/ 2022 | 61/2023 | ජී.ආර්.ඒ. ගොඩගම | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු පොදු අධිකාරිය විසින් සැපයූ බව හා සෑහීමකට පත් වන බව දන්වා ඇත. එබැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 62 | 56/2023 | 62/2023 | ඒ.එස්. අමරසිංහ | කොළඹ මහ නගර සභාව | සම්පූර්ණ තොරතුරු මුදා හැර නොමැති බැවින් පොදු අධිකාරියට තොරතුරු මුදා හැරීම සඳහා උපදෙස් දෙමින් පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 63 | 147/2023 | 63/2023 | එල්.ඒ. එෆ්.වී. ප්‍රනාන්දු | ලංකා විදුලිබල මණ්ඩලය | පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ තීරණයට අනුකූලව ක්‍රියා කර ඇති අතර පැහැර හැරීමක් සිදු කර නොමැති බැවින් පනතේ 39 වගන්තිය යටතේ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවන බවට තීරණය කර ඇත. |
| 64 | 589/2022 | 64/2023 | එෆ්.එච්. කේ.එච්.ද සිල්වා | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය කොමිෂන් සභාවේ තීරණයට අනුකූල වීම පැහැර හැර ඇති බවට තීරණය කරමු. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | පිළිබඳ පනතේ 39 වන වගන්තිය යටතේ පොදු අධිකාරියට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත. |
| 65 | 434/2021 | 65/2023 | එස්. එන්.පී. කුමාර | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | අභියාචක අංක 3 යටතේ ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට අවස්ථාව ලබා දෙන අතර අංක 4 යටතේ ඉල්ලා ඇති තොරතුරු ඉදිරි දිනට පෙර ලබා දීමට පොදු අධිකාරිය ක්‍රියා කල යුතුය. ඒ අනුව පරීක්ෂණය 2024.02.22 දිනට කල් තබා ඇත. |
| 66 | 383/2021 | 66/2023 | සී. අමරසිංහ | මධ්‍යම පරිසර අධිකාරිය | අභියාචක පැමිණ නොමැති බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 67 | 1123/ 2022 | 67/2023 | එච්.එල්.යූ. සම්පත් | බහුකාර්ය සමූපකාර සමිතිය- ඇල්පිටිය | පොදු අධිකාරිය විසින් අභියාචක වෙත ප්‍රතිචාර දක්වන ලද බවට කරුණු ඉදිරිපත් කරයි. ඉදිරිපත්ව ඇති කරුණු සලකා බලා පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 68 | 566/2022 | 68/2023 | ජේ.ඒ. ඩී.කේ. ජයකොඩි | සුළු බෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු මුදා හැරීම සඳහා පොදු අධිකාරියට දින ලබා දෙයි. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 69 | 466/2022 | 69/2023 | ඩී.කේ.කීර්ති තිස්ස | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මහනුවර | සම්පූර්ණ තොරතුරු මුදා හැර නොමැති බැවින් පොදු අධිකාරියට තොරතුරු මුදා හැරීම සඳහා උපදෙස් දෙමින් විමසීම කල් තබා ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 70 | 845/2022 | 70/2023 | කනපතිපිල්ලෙයි තෙවරත්නම් | මානව හිමිකම් කොමිෂන් සභාව | අභියාචක ඉල්ලා සිටින තොරතුරු අපහරණය වී ඇති බව පොදු අධිකාරිය ප්‍රකාශ කරන |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| | | | | | අතර අභියාචක දැනුවත් කර නොමැත. කරුණු සනාථ කරමින් අභියාචක වෙත ප්‍රතිචාරයක් යැවීමට පොදු අධිකාරිය භාරගනිමින් පරීක්ෂණය අවසන් කරන ලදි. |
| 71 | 856/2021 | 71/2023 | ජී.බී. විජේසිංහ | මෝටර් රථ දෙපාර්තමේන්තුව | අභියාචකට නිසි පරිදි නොතීසි නොලැබුනු බැවින් පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 72 | 692/2022 | 72/2023 | එස්.ඒ. කමලසේන | ලංකා සීනි (පෞද්ගලික) සමාගම | ඉල්ලා ඇති තොරතුරු වලින් කොටසක් පමණක් ලබා දී ඇති හෙයින් පොදු අධිකාරියට තවත් එක් අවස්ථාවක් ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 73 | 564/2021 | 73/2023 | එච්.එම්.පී. බන්ඩාර | වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය | අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේදී අභියාචක වෙත මුදා හරින අතර අභියාචක ඉන් සැහීමකට පත් වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 74 | 825/2021 | 74/2023 | එස්. එන්.පී. කුමාර | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | පොදු අධිකාරිය කොමිෂන් සභාවේ තීරණයට අනුකූලව ක්‍රියා කර ඇති බවට සනාත වන බැවින් පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |
| 75 | 342/2022 | 75/2023 | ආර්. තේනබදු | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ ඇති බවට සනාත නොවේ. තීරණයට අනුකූල වීම පැහැර හැර ඇති බවට චොදනා කරමින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොමැත. පරීක්ෂණය අවසන් කිරීමට තීරණය කර ඇත. |

| අංක | අභියාචනා අංකය | පරීක්ෂණයේ අංකය | අභියාචක | පොදු අධිකාරිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 76 | 445/2022<br>503/2022 | 76/2023 | ඩබ්. එම්.ඒ.පී. වාසලමුදලි | වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය - පොළොන්නරුව | කොමිෂන් සභාවේ තීරණයට අනුව පොදු අධිකාරිය ක්‍රියා කර නොමැත. ඒ අනුව තොරතුරු මුදා හැරීම සඳහා පොදු අධිකාරියට තවත් දිනයක් ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 77 | 388/2022 | 77/2023 | කේ.එම්.ජයසිරි | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | පොදු අධිකාරිය තවමත් ඉල්ලා ඇති තොරතුරු ලබා දී නොමැති බැවින් තොරතුරු ලබා දීම සඳහා අවසන් දිනයක් ලබා දී ඇත. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |
| 78 | 1480/<br>2022 | 78/2023 | ඩී.ගාමිණී | කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව | තොරතුරු පිළිබඳ සලකා බැලීම සඳහා තවදුරටත් පොදු අධිකාරයට කාලය ලබා දෙයි. ඒ අනුව පරීක්ෂණය 2024.01.05 දිනට කල් තබා ඇත. |

# 6. වාර්තා ආදිය ඉදිරිපත් කිරීමට පොදු අධිකාරිය සතු කාර්යය භාරය

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 10 වගන්තිය ප්‍රකාරව සෑම පොදු අධිකාරියක් විසින්ම වර්ෂය තුළදී ලැබුණු මුළු ඉල්ලීම් ගණන සහ සපයන ලද සහ ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ප්‍රමාණය, වර්ෂය තුළදී ඒකතු කරනු ලැබූ ගාස්තු මුදල, 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් ගණන, කොමිෂන් සභාවේ විධානය පරිදි තොරතුරු සපයන ලද වාර ගණන, විනිවිදභාවය පිළිබඳ පවත්නා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නම් යෝජනා, තොරතුරු සන්නිවේදනය කිරීම, ප්‍රතික්ෂේප කිරීම මගින් පැන නගින අභියාචනා සංඛ්‍යාව, වාර්තා පවත්වාගෙන යෑම, කළමනාකරණය සහ විනාශ කිරීමට අදාළ පරිචයන් සහ 8 වන වගන්තිය යටතේ ස්වකීය කර්තව්‍යයන් ඇතුළත් කරමින් වාර්ෂික වාර්තාවක් සකස් කර ඒකී වාර්තා අදාළවන වර්ෂයට ඉක්බිතිව එළඹෙන වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුවේ.

එසේ යොමු කළ වාර්ෂික වාර්තා පහත පරිදි දැක්වේ.

**වගුව 13 – 2023** වර්ෂයේ දී පොදු අධිකාරියක් විසින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම්

| අංක | පනතේ 43 වගන්තිය අනුව වර්ගීකරණය | වර්ගීකරණයට අනුව පොදු අධිකාරීන් | සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) | ආණ්ඩුවේ අමාත්‍යාංශයක් | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | 11 |
| | | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | |
| | | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | |
| | | අධ්‍යාපන අමාත්‍යාංශය | |
| | | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | |
| | | වාරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය | |
| | | ජනමාධ්‍ය අමාත්‍යාංශය | |
| | | කෘෂිකර්ම අමාත්‍යාංශය | |
| | | ආරක්ෂක අමාත්‍යාංශය | |
| | | පරිසර අමාත්‍යාංශය | |
| | | ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | |
| ආ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ (ඉ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර 2007 අංක 7 දරණ සමාගම් පනත හැර යම් ලිඛිත නීතියක් හෝ පළාත් සභාවක ප්‍රඥාප්තියක් මගින් හෝ යටතේ පිහිටුවන ලද යම් මණ්ඩල හෝ කාර්‍යාල | යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා | 72 |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගෝනාපිනුව | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වැලිගෙපොල | |
| | | බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - මදුරාවල | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | |

| අංක | පනතේ 43 වගන්තිය අනුව වර්ගීකරණය | වර්ගිකරණයට අනුව පොදු අධිකාරීන් | සංඛ්‍යාව |
|---|---|---|---|
| | | තුම්පනේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ගලගෙදර | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ලග්ගල | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කිරිඇල්ල | |
| | | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වරකාපොල | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - උකුවෙල | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යාපනය | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නොච්චියාගම | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉඹුල්පෙ | |
| | | ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - දැරණියගල | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පුජාපිටිය | |
| | | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මන්මුනේ උතුර | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හෝමාගම | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තඹුත්තේගම | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය පස්බාගේ කෝරළේ - නාවලපිටිය | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාච්චාදුව | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - අම්බලන්ගොඩ | |
| | | රත්තොට ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කයිකාවල | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - මුලටියන | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - අයගම | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පාතහේවාහැට | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - මල්ලවපිටිය | |

| අංක | පනතේ 43 වගන්තිය අනුව වර්ගීකරණය | වර්ගිකරණයට අනුව පොදු අධිකාරීන් | සංඛ්‍යාව |
|---|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇලපාත | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ගොඩකාවෙල | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කහවත්ත | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කඹුරුපිටිය | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කුරුවිට | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - පොල්ගහවෙල | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කුච්චවෙලි | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගල්නෑව | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වෙංගලසෙට්ටිකුලම් | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | |
| | | ජනාධිපති කාර්යාලය | |
| | | අග්‍රාමාත්‍ය කායාලය | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කන්තලේ | |
| | | වෙළඳ නාවික ලේකම් කාර්යාලය | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කරන්දෙණිය | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කුලියාපිටිය නැගෙනහිර | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අලව්ව | |
| | | දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලය - මුලතිව් | |
| | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | |
| | | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කඩවත් සතර, ගාල්ල | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ඇහැලියගොඩ | |
| | | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | |
| | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - උඩුබද්දාව | |
| | | ශ්‍රී ලංකා මහ බැංකුව | |

| අංක | පනතේ 43 වගන්තිය අනුව වර්ගීකරණය | වර්ගීකරණයට අනුව පොදු අධිකාරීන් | සංඛ්‍යාව |
|---|---|---|---|
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - ඔපනායක | |
| | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇඹිලිපිටිය | |
| | | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - මහරගම | |
| | | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත් | |
| | | ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය | |
| | | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | |
| | | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා | |
| (ඇ) | ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 9 |
| | | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | |
| | | ශ්‍රී ලංකා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | |
| | | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | |
| | | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | |
| | | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | |
| | | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| | | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | |
| | | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා | |
| (ඈ) | රාජ්‍ය සංස්ථාවක් | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 2 |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | |
| (ඉ) | සිය කොටස්වලින් 25% ක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අනන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගම් | ශ්‍රී ලංකා ගුවන් සේවය | 1 |
| (ඊ) | පළාත් පාලන ආයතන | බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම | 19 |
| | | හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව | |
| | | පාණදුර නගර සභාව | |
| | | කුරුවිට ප්‍රාදේශීය සභාව | |
| | | මොරටුව මහ නගර සභාව | |
| | | පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව | |

| | | | |
|---|---|---|---|
| | | වාරියපොල ප්‍රාදේශීය සභාව | |
| | | හම්බන්තොට ප්‍රාදේශීය සභාව | |
| | | රඹුක්කන ප්‍රාදේශීය සභාව | |
| | | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - මැණික්හින්න | |
| | | කුලියාපිටිය නගර සභාව | |
| | | යටවත්ත ප්‍රාදේශීය සභාව | |
| | | මහා නගර සභාව - දඹුල්ල | |
| | | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව | |
| | | බියගම ප්‍රාදේශීය සභාව - දෙල්ගොඩ | |
| | | පුජාපිටිය ප්‍රාදේශීය සභාව - ප්‍රාදේශීය සභා කාර්යාලය - පුජාපිටිය | |
| | | සූර්යවැව ප්‍රාදේශීය සභාව | |
| | | කඩුවෙල මහා නගර සභාව | |
| | | දික්වැල්ල ප්‍රාදේශීය සභාව | |
| (උ) | ආණ්ඩුව හෝ එහි නියෝජ්‍යායතනයක හෝ පළාත් පාලනආයතනයක කොන්ත්‍රාත්තුවක්, හවුල් ව්‍යාපාරයක්, ගිවිසුමක්, බලපත්‍රයක් යටතේ ව්‍යවස්ථාපිත හෝ පොදු කර්තව්‍යයන්ගෙන් හෝ පොදු සේවාවන්ගෙන් ආවරණය වූ ක්‍රියාකාරකම් ප්‍රමාණයකට පමණක් සිමාවූ පෞද්ගලික හිමිකාරිත්වයක් හෝ සංවිධාන | | 0 |
| ඌ) | පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතන | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - ප්‍රාදේශීය කාර්යාලය කෑගල්ල | 36 |
| | | උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | |
| | | ප්‍රධාන අමාත්‍යාංශය - උතුරු මැද පළාත | |
| | | පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය - උතුරු මැද පළාත | |
| | | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පර්වාස සහ ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත | |
| | | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - උතුරු මැද පළාත | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත | |
| | | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත | |

| | | | |
|---|---|---|---|
| | | සභා ලේකම් කාර්යාලය - සබරගමුව පළාත් සභාව | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත | |
| | | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත් | |
| | | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | |
| | | සමුපකාර සේවක කොමිෂන් සභාව | |
| | | සබරගමුව පළාත් සභාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව - සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර | |
| | | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුර පළාත | |
| | | ප්‍රවාහන සේවා අධිකාරිය - මධ්‍යම පළාත | |
| | | සෞඛ්‍ය දේශීය වෛද්‍ය , සමාජ සුභ සාධන, පර්වාස සහ ළමාරක්ෂණ සේවා , කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය - වයඹ පළාත් සභාව | |
| | | සමුපකාර සේවය කොමිෂන් සභාව - උතුරු මැද පළාත් සභාව | |
| | | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - දකුණු පළාත | |
| | | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත | |
| | | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - වයඹ පළාත | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය - නැගෙනහිර පළාත | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය - සබරගමුව පළාත් සභාව | |
| | | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත | |
| | | ප්‍රධාන අමාත්‍යාංශය - සබරගමුව පළාත | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය උතුරු පළාත - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය ඉංජිනේරු සේවා - පළාත් සභා සංකීර්ණය | |
| | | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු පළාත් සභාව | |
| | | සමූපකාර සේවා කොමිෂන් සභාව - සබරගමුව පළාත් සභාව | |
| | | ඌව පළාත් සභාව - ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය | |
| | | සමූපකාර සේවා කොමෂන් සභාව - (දකුණු පළාත්) | |

| | | | |
|---|---|---|---|
| | | කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන, අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය - උතුරු මැද පළාත | |
| | | ප්‍රධාන ලේකම් කාර්යාලය උතුරු පළාත් සභාව - පළාත් අභයාන්තර විගණන කාර්යාලය | |
| | | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත් | |
| | | වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය | |
| | | රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභාව හා පළාත් පාලන අමාත්‍යාංශය | |
| (එ) | මහජනතාව වෙත සේවයක් ලබාදෙනු ලබන සහ ඉල්ලා සිටින ලද තොරතුරු මහජනතාව වෙත ලබාදෙනු ලබන සේවයට අදාළ වනතාක් දුරට ආණ්ඩුව හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් මගින් පිහිටුවන ලද හෝ ඇතිකරන ලද වෙනත් අධිකාරියක් හෝ විදේශීය ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් මගින් සැලකිය යුතු ප්‍රමාණයක් අරමුදල් සපයනු ලබන රාජ්‍ය නොවන සංවිධාන | | 0 |
| (ඒ) | යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, හඳුනාගනු ලබන හෝ බලපත්‍රයක් ලබාදෙනු ලබන හෝ රජය මගින් හෝ රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇතිකරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් මුල්‍යාධාර සපයන පෞද්ගලික විශ්ව විද්‍යාල සහ වෘත්තීය ආයතන ඇතුළු උසස් අධ්‍යාපන ආයතන | | 0 |

| | | | |
|---|---|---|---|
| (ඔ) | යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලබන, පිළිගනු ලබන හෝ බලපත්‍රයක් ලබාදෙනු ලබන හෝ රජය මගින් රාජ්‍ය සංස්ථාවක් මගින් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් යටතේ පිහිටුවනු ලබන හා ඇති කරනු ලබන යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් මගින් පූර්ණ වශයෙන් හේ අර්ධ වශයෙන් මුල්‍යාධාර සපයන වෘත්තීය හෝ කාර්මික අධ්‍යාපනය ලබාදෙන ආයතන ඇතුළු පුද්ගලික අධ්‍යාපන ආයතන | | 0 |
| (ඕ) | යුක්තිය පසඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකරණ හා ආයතන | | 0 |
| | එකතුව | | 150 |

## 7. තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අන්තර්ජාතික දිනය සැමරීම

එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් සෑම වසරකම සැප්තැම්බර් මස 28 දින ජාත්‍යන්තර තොරතුරු දිනය ලෙස 2002 සිට 2019 දක්වා සමරන ලදී. නමුත් එම දිනය 2019 වර්ෂයේ සිට තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අන්තර්ජාතික දිනය ලෙස නම්කරන ලද අතර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව ද 2017 වර්ෂයේ සිට මෙම දිනය සමරන ලදී.

2023 වර්ෂයේ ද ලෝකේ රටවල් 26 ට වැඩි ප්‍රමාණයක් සමඟ එක්වී අප තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව, මෙම ජාත්‍යන්තර දිනය දේශීය හා විදේශීය ලෙස සමරන ලදී.

කොමිෂන් සභාව නිල වශයෙන් මෙවර තොරතුරු සඳහා වූ ජාත්‍යන්තර දිනය  සමරන ලද්දේ කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය. එහිදි රාජ්‍ය අංශයේ මෙන්ම සිවිල් ප්‍රජාව සඳහා තොරතුරු පනත පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරන ලද අතර මීට සමගාමී වශයෙන් දකුණු පළාත් සභාවට අයත් සියලුම ආයතනවල නම්කළ නිළධාරීන් හා තොරතුරු නිළධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද සිදු කරන ලදී.

එයට අමතරව යාල් ටීවී රූපවාහිනී නාලිකාව ඔස්සේ තොරතුරු පනත පිළිබඳව දැනුවත් කිරීමක් කොමිෂන් සභාවේ සාමාජික, කොමසාරිස් නීතිඥ ජගත් ලියන ආරච්චි මහතා විසින් සිදු කරන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් සහ තිරසාර සංවර්ධනය සහතික කිරීමේ කාර්යභාරය තේමාව කරගෙන යුනෙස්කෝ අනුග්‍රහයෙන් නව දිල්ලි නගරයේ 2023 සැප්තැම්බර් 28 වන දින තොරතුරු සඳහා ප්‍රවේශවීමේ ජාත්‍යයන්තර දිනය (IDUAI)  මාර්ග ගත කලාපිය සැමරුමක් ලෙස පැවැත්විණි.  එම අවස්ථාවට මෙම කොමිෂන් සභාවේ සාමාජික, කොමසාරිස් නීතිඥ කිශාලි පින්ටෝ - ජයවර්ධන මෙය ‘‘ව්‍යවස්ථාව සුරැකීම’’ මැයෙන් ප්‍රධාන දේශනය මාර්ග ගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී .

# 8. පරිපාලනය හා මූල්‍ය කාර්යය සාධනය

## 8.1 කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය

මෙම කාලපරාසය තුළ කොමිෂන් සභාව එහි කාර්යයන් හා කර්තව්‍යයන්, සම්පත් සීමිත වීම තුළින් පැන නැඟි විශාල දුෂ්කරතා රාශියක් මධ්‍යයේ පවත්වාගෙන යන ලදී. කෙසේ නමුත් අවම භෞතික, මූල්‍ය හා මානව සම්පත් යටතේ වුවද එහි ප්‍රධාන කාර්යභාරය වන අභියාචනා විභාගයට ගැනීම, මහේස්ත්‍රාත් අධිකරණයේ හා අභියාචනාධිකරණයේ නඩු කටයුතු සහ කොමිෂන් සභාවේ තීරණ වලට අනුකූල නොවීමේ පරීක්ෂණ සිදු කිරීමට කොමිෂන් සභාවට හැකි විය.

කොමිෂන් සභාවේ කායී මණ්ඩලය දසදෙනෙකු පමණක් විය. නව බඳවා ගැනීම් සහ අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශවයන්ට ඉල්ලීම් ඉදිරිපත් කෙරිනි.

| තනතුර | අනුමත කායීය මණ්ඩලය | තත්‍ය තත්වය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී | 01 | - |
| පර්යේෂණ නිළධාරී | 01 | 01 |
| නීති නිළධාරී | 01 | - |
| පරිපාලන නිළධාරී | 01 | 01 |
| මූල්‍ය නිළධාරී | 01 | 01 |
| නීති සහකාර | 04 | - |
| සංවර්ධන නිළධාරී | 04 | 01 |
| භාෂා පරිවර්ථක | 01 | - |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 |
| කළමනාකරණ සහකාර | 04 | 01 |
| පුද්ගලික සහකාර | 01 | 01 |
| රියදුරු | 03 | 01 |
| කායීයාල කායීය සහායක | 02 | 01 |
| එකතුව | 26 | 10 |

2023 වර්ෂයේදී රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිළධාරි කමිටුව මගින් මෙම කොමිෂන් සභාවේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවාගැනීමට අනුමැතිය ලැබිණි. ඒ අනුව පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවා ගැනීම් දෙසැම්බර් මස වන විට සිදුකරමින් පවතී.

## 8.2 මූල්‍ය පාලනය

කොමිෂන් සභාවේ මුළු මූල්‍යකරණය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

| අයිතමය | අය වැය ප්‍රතිපාදන රු. | මුළු වියදම රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 43,970,000.00 | 43,748,331.89 | 99% |
| ප්‍රාග්ධන වියදම් | 1,500,000.00 | 1,498,771.20 | 100% |
| මුළු වියදම් | 45,470,000.00 | 45,247,109.09 | 99% |

R0026

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | PIC/B/RTIC/1/23/31 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024 ජූනි 06 දින |

පේලාව
25 JUN 2024
මුද්‍රණ අංශය
ජනමාධ්‍ය
කොළඹ 05.

RECEIVED
Ministry of Mass Media
Information
20 JUN 2024
Letter No. 3049

අධ්‍යක්ෂ ජනරාල්,

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- 01. ලේකම් - ජනමාධ්‍ය අමාත්‍යාංශය.

02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

Ms Damayanthi 26/06

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


(31)

මගේ අංකය
எமது இல.
My No. PIC/B/RTIC/1/23/31

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 ජූනි 06 දින

අධ්‍යක්ෂ ජනරාල්,
තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව.

**තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.


50

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) කොමිෂන් සභාව විසින් හීනවන ශේෂ ක්‍රමයට වත්කම් ක්ෂය කර තිබුණු නමුත් එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 86 (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂවල ලැබී තිබූ එකතුව රු.10,362,333 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 (සංශෝධනය) ප්‍රකාරව ආදායමට නොගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස දක්වා තිබීම් නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන රඳවාගැනීමේ ඉපයීම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද ප්‍රකාශිත ප්‍රාග්ධන ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ආ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් 2023 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.4 වගන්තිය | 2018 වර්ෂයේදී කොමිෂන් සභාව ආරම්භ කර තිබුණු අතර අදාල විධිවිධාන ප්‍රකාරව මේ දක්වා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව සහ ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් (මාස 05) ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව ඇතුලත්ව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව සඳහන් වුවත් මෙම වාර්තාවේ දින වන විටත් කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර කොමිෂන් සභාව විසින් 2021 සහ 2022 වර්ෂයන්වලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරද නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇත්තා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් සභාපති ඇතුළු සාමාජිකයින් 5 ක් කොමිෂන් සභාවට පත් කරනු ලබයි. 2016 අංක 12 දරන කොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂක ජනරාල්වරයා වන අතර කොමිෂන් සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන බවට තීරණය කරනු ලබන නිලධාරීන් සහ සේවා නියුක්තිකයන් සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු වේ. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාවේ අනුමත මුළු සේවක සංඛ්‍යාව 26 ක් වුවත් තත්‍ය සේවක සංඛ්‍යාව 10 ක් වූයෙන් පුරප්පාඩු 16 ක් පැවතුනි.

(ආ) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආරම්භයේ සිටම ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණු අතර එම තනතුර කොන්ත්‍රාත් පදනම් හා වැඩ බැලීමේ පදනම් මත සම්පූර්ණ කර තිබුණි. තවද 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර, නීති නිලධාරී තනතුර හා නීති සහකාර තනතුරු 04 පුරප්පාඩුව පැවතීම කොමිෂන් සභාවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී බැහැර කළ නොහැක.

(ඇ) ඉකුත් වර්ෂයේ රු.51,500 කට මිලදීගෙන තිබුණු ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයේ වාර්ෂික සේවා කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව හා අදාල සමාගම අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. එසේම යන්ත්‍රයෙන් පැමිණීමේ හා පිටවීමේ වේලා සටහන් වාර්තා ලබාගෙන නොතිබුණු අතර විගණිත දිනය වූ 2024 අප්‍රේල් 10 වන විට මෙම යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.